# <u>සංචාරක බංගලාවේ නවාතැන් ගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු</u>

- සංචාරක බංගලාවේ කාමර වෙන් කරවා ගන්නා අයදුම්කරු නවාතැන් ගැනීම අනිවාර්ය වේ.
- අවසර ලබා දී ඇති නේවාසික සංඛ්‍යාව පමණක් සංචාරක බංගලාවේ නවාතැන් ගැනීමට වගබලා ගත යුතුය.
- නවාතැන් ගැනීමට අනුමැතිය ලත් සියලුදෙනා තම අනන්‍යතාවය සනාථ කර ගැනීම සඳහා සංචාරක බංගලා භාරකරු වෙත තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.
- නවාතැන් ගැනීම සඳහා දවස ආරම්භය ප.ව. 1.00 ද කාමරයෙන් නික්ම යාම පසුදා පෙ.ව. 11.00 ද වේ.
- සංචාරක බංගලාවේ නවාතැන් ගන්නා කාලසීමාව ඇතුලත එහි ඇති දේපළ වලට හානියක් නොවන පරිදි හැසිරිය යුතුය. එවැනි අලාභයක් සඳහා අදාල වටිනාකම ඔබගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ඇත.
- සංචාරක බංගලා භූමියේ ඇති මල් පැළ හා වෙනත් බෝගයන් වලට හානි නොකළ යුතු අතර මල් කැඩීමෙන් ද වැළකිය යුතුය.
- 2006 අංක 27 දරණ දුම්වැටි සහ මධ්‍යසාර පනත ප්‍රකාරව මත්පැන් හෝ දුම්වැටි සංචාරක නිවාසයට ගෙන යාම, ළඟ තබා ගැනීම හෝ භාවිතා කිරීම සපුරා තහනම් වේ.
- සංචාරක බංගලාවේ උත්සව සහ ප්‍රියසම්භාෂණ පැවැත්වීම සපුරා තහනම් වේ.
- සංචාරක බංගලාවේ ගත කරන කාල සීමාව තුලදී භාවිතා කරනු ලබන දුරකථන, ජල, විදුලිය, ඇඳ ඇතිරිලි, කොට්ට උර, බ්ලැන්කට්, වැනි දෑ සඳහා ගාස්තු අය කරනු ලැබේ. එම ගාස්තු බංගලා භාරකරුට ගෙවා පොදු 172 ආකෘතියේ ලදු පතක් ලබා ගත යුතුය.
- කාමර අංක 02 සහ 03 අමුත්තන් කාණ්ඩ 02 ක් භාවිතා කරන්නේ නම් ජල සහ විදුලි ගාස්තු එක් එක් කාමරයේ නවාතැන් ගන්නා සංඛ්‍යාවට සමානව බෙදනු ලැබේ.
- රූපවාහිනී යන්ත්‍රය පවතිනුයේ පොදු භාවිතය සඳහා පමණි.
- සංචාරක බංගලාවේ කාමර වල අමුත්තන් කාණ්ඩායම් දෙකක් නවාතැන් ගනීනම් අනෙක් කණ්ඩායමට හිරිහැරයක් නොවන පරිදි හැසිරීමට වග බලා ගත යුතුය.
- කුඩා ළමුන් රැගෙන එන අය මෙට්ට, ඇඳ ඇතිරිලි සහ බ්ලැන්කට් ආදිය අපවිත්‍ර වීමෙන් වැළැක්වීමට වගබලා ගත යුතුය. එසේ නොවන්නේ නම් ඒවා පවිත්‍ර කිරීම සඳහා වෙනම ගාස්තු ගෙවිය යුතුය.
- මුළුතැන්ගෙය පරිහරණය බංගලා භාරකරුට පමණක් සීමා වී ඇත. අමුත්තන්ගේ අවශ්‍යතාවයන් ඔහු මඟින් ඉටු කරවා ගත හැක.
- ඔබ ලබා ගන්නා ආහාර පාන සඳහා නියමිත ගාස්තු බංගලා භාරකරු වෙත ගෙවිය යුතුය.
- සංචාරක බංගලාවේ ගත කරන කාලය තුල සිදු කරන යම් අයථා ක්‍රියාවන් සම්බන්ධයෙන් ඔබට විරුද්ධව යම් පැමිණිල්ලක් ලද හොත් ඉදිරියේදී සංචාරක බංගලාව වෙන් කිරීම සඳහා ඔබගෙන් ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- මෙම සංචාරක බංගලාව පරිහරණයේදී යම් ගැටළුවක් හෝ අවහිරතාවයක් සිදු වූයේ නම් 0112694846 / 0112694847 යන දුරකථන අංක වලට හෝ 0112698311 යන ෆැක්ස් අංකයට හෝ අධ්‍යක්ෂ ජනරාල්, නො: 383, බෞද්ධාලෝක මාවත, කොළඹ 07. යන ලිපිනයට දැනුම් දෙන මෙන් ඉල්ලා සිටිමි.
- ඉහත සඳහන් උපදෙස් හෝ සඳහන් නොවන කරුණු සම්බන්ධයෙන් කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.